**ජාතික මූලික අධ්‍යයන ආයතනය - 2023**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවති.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතනය සතු පේටන්ට් බලපත්‍ර 06 ක වටිනාකම තක්සේරු කර අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ආයතනයේ විද්‍යාඥයින් හා නවෝත්පාදන ආයතනයේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් පේටන්ට් බලපත්‍ර තක්සේරු කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂය තුළදී වසර 30 ක කාලයක් සඳහා බදු පදනම මත රු.22,440,000 ක වටිනාකමකට ලබා ගන්නා ලද හන්තාන පතන වත්ත නිවැරදි ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් හන්තාන පතන වත්තේ ලියාපදිංචි බදු ඔප්පුව මේ දක්වාම ආයතනය වෙත එවීමට කටයුතු කර නොමැති බව. | ආයතනයේ වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ස්ථාවර වත්කම් ගිණුමෙන් ඉවත් කරන ලද ශුද්ධ අගය රු.2,723,251 ක් වූ හානි වූ, භාවිතයට ගත නොහැකි හා සොයාගත නොහැකි වත්කම්, ලියා හැරීම හෝ අය කරන තෙක් වත්කම් යටතේ දැක්විම වෙනුවට එම වත්කම් වලට අදාල රු.10,996,955ක් ප්‍රත්‍යාගණන සංචිතයෙන් ඉහත අගය අඩුකර රු.8,273,704ක් ස්ථාවර වත්කම්හි ශුද්ධ අගය ලෙස ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි. | වාර්ෂිකව ප්‍රත්‍යාගණන සංචිත ඉවත් නොකර ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව වත්කම් ඉවත්කිරීම කරන අවස්ථාවේදී අදාළ ගැලපීම සිදු කරන බව. . | පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ රු.2,942,550 ක් වූ හිඟ වැටුප් හා වෙනත් ගෙවීම් රු.2,859,212 ක් ලෙස දැක්වීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.83,338 ක වෙනසක් නිරීක්ෂණය වුණි. | මෙම වෙනස ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව . | ගිණුම්කරණ මූලධර්මවලට අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල (රු) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| පර්යේෂණ ව්‍යාපෘති | 100,040,521 | ගිවිසුම් ලිපිගොනු හා අනිකුත් ලේඛන | අදාළ ලිපි ගොනු විගණනය සඳහා ඉදිරිපත් කරන බව. | විගණනයට අදාළ සියලු තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | චක්‍රලේඛ<br>---------- | | | |
| (අ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.12 ඡේදය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව 2019 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාළව ආයතනයේ දායකත්වය වශයෙන් රු.6,582,112 ක මුදලක් සේවක අග්‍රහාර රක්ෂණ අරමුදල වෙතද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.4,300,820 ක මුදලක් සේවක තේ පැන් සංග්‍රහ වියදම් ලෙසද ගෙවා තිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය වෙනම ලබා ගැනීමක් සිදු කර නොමැති බව හා වර්ෂයේ අයවැය ලේඛනයට එම මුදල ඇතුළත් කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති PE 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 ඡේදය | මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත ආයතනයේ විගණිත වාර්තාව සමඟ පසුගිය වර්ෂයේ කාර්යසාධනය ඇතුළත් වාර්ෂික වාර්තාව භාෂා ත්‍රිත්වයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2020, 2021 හා 2022 වර්ෂයන්ට අදාළව වාර්ෂික වාර්තා මේ දක්වාම පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | අදාළ සංශෝධනයන් සිදු කර අමාත්‍යාංශය වෙත මේ වන විට යොමු කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,242,947 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.38,707,333 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.42,950,280 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. මෙම වර්ධනයට පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය සතු සේවක අර්ථසාධක අරමුදලට අයත් ස්ථාවර තැන්පතු ගිණුම් 20 කට අදාළ රු.201,880,632 ක කල් පිරී තිබුණු ආයෝජනයන් සමාලෝචිත වර්ෂය තුළ නැවත මිල ගණන් කැඳවා ආයෝජනය කළ යුතු වුවත්, එසේ නොකර නැවත එම බැංකුවේම ආයෝජනය කර තිබුණි. | පැවති ආර්ථික අර්බුදයන් හමුවේ පොලී අනුපාත එක් වරම ඉහළ ගිය බැවින් ආයතනයට විධිමත්ව මිල ගණන් කැඳවා එය සිදු කිරීමට කල් ගත වන බැවින් වාචිකව මිල ගණන් විමසා හොඳම විකල්ප ආයෝජනය සිදු කර ඇති බව. | අරමුදල් කාර්යක්ෂම හා උපරිම ප්‍රතිලාභ අත්වන අයුරින් ආයෝජනය කළ යුතුය. |

**3.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් වසර 02 ක කාලයක සිට බදු පදනම මත ලබාගෙන ඒ සඳහා රු.1,496,000 ක් ගෙවා ඇතත්, එම ඉඩම අරමුණුගත කාර්යයන් වෙනුවෙන් යොදවා නොගෙන නිෂ්ක්‍රියව පැවතුණි. | 2024 වර්ෂයේදී පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීමට යෝජිත බව. | අපේක්ෂිත අරමුණු ඉටු කර ගත හැකි වන පරිදි උපරිම ධාරිතාවයෙන් වත්කම් උපයෝජනය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අනුමත ප්‍රසම්පාදන සැලැස්මෙන් බැහැරව හා අනුමැතියකින් තොරව රු.14,350,305 ක ප්‍රසම්පාදන කාර්යයන් 07 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණි. | පරිසර අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ දඹුල්ල රුක් උද්‍යානයේ ක්‍රියාත්මක ව්‍යාපෘති 7ක් කඩිනමින් නිම කිරීමට උපදෙස් ලබා දී තිබූ බැවින් ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර නොමැති බව. | අනුමත ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජන

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය ආරම්භයේ සිට මේ දක්වා පර්යේෂණ ව්‍යාපෘති 06 කට අදාළව ලැබී තිබුණු පේටන්ට් බලපත්‍ර 06 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විටත් අලෙවි කිරීමට හෝ වෙනත් ආකාරයකින් උපයෝජනය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | දැනට සක්‍රීයව පවතින පේටන්ට් බලපත්‍ර සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති බව. | පේටන්ට් බලපත්‍ර ප්‍රශස්ථ අයුරින් උපයෝජනය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ ප්‍රදාන 09 කට අදාළ රු.1,333,984 ක අරමුදල් සමාලෝචිත වර්ෂය තුළදීම උපයෝජනය නොකර නිෂ්කාර්යව පැවතුණි. | 2024 වර්ෂය තුළ දී ව්‍යාපෘති 03 ක අරමුදල් භාවිතයට ගෙන ඇති අතර ඉතිරි මුදල් පර්යේෂණ අරමුදලට බැර කිරිමට නියමිත බව. | අරමුදල් අදාල කාර්යයන් සඳහා ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |